ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව

භාෂා පරිවර්තක (සිංහල / දෙමළ - දෙමළ / සිංහල) 1 වන පන්තිය සඳහා බඳවා ගැනීම

භාෂා පරිවර්තක (සිංහල / දෙමළ - දෙමළ / සිංහල) 1 වන පන්තිය - තනතුරු 01
ඉහත තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

අධ්‍යාපන සුදුසුකම් :

(1) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) හෝ ඊට සමාන විභාගයක දී අදාළ පරිවර්තන භාෂා මාධ්‍ය 02 සඳහා සම්මාන සාමාර්ථ්‍යය ලබා තිබීම හෝ ඊට උසස් සුදුසුකමක් ලබා තිබීම;

සහ

(2) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම;

සහ

(3) සිංහල/ දෙමළ භාෂා දෙකෙන් පරිගණක වදන් සැකසීමේ හැකියාව පිළිබඳ ප්‍රායෝගික පරීක්ෂණයකින් සමත් විය යුතු ය.

වැටුප් පරිමාණය : මාසික දීමනාව (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 අනුව සියලු දීමනා ඇතුළත් මාසික දීමනාව)
2026 වර්ෂය සඳහා - රු. 86,623/- (68,823/- + 17,800/-)
2027 වර්ෂය සඳහා - රු. 93,290/- (75,490/- + 17,800/-)

වැටුප් කේතය : රා.ප.ච. 10/2025 අනුව එම්.එන්. - 6 (MN - 6 2025)

වයස : අයදුම්කරුවන් වයස අවුරුදු 21 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 65 ට නොවැඩි විය යුතු ය.

සේවා නියුක්ති කොන්දේසි: පවතින පුරප්පාඩු ස්ථිර පදනමින් පුරවන තෙක් හෝ වසර දෙකක (02) කාල සීමාවක් සඳහා යන දින දෙකෙන් පළමුව එළඹෙන දිනය දක්වා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබේ.

බඳවා ගැනීමේ ක්‍රමය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් සහ ප්‍රායෝගික පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වන අයදුම්කරුවන් අතරින් අදාළ සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන අයදුම්කරුවන් පමණක් ප්‍රායෝගික පරීක්ෂණයට යොමු කරනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් සහ ප්‍රායෝගික පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙළ අනුව බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

- පරිවර්තනය - සිංහල භාෂාවෙන් දෙමළ භාෂාවට
- පරිවර්තනය - දෙමළ භාෂාවෙන් සිංහල භාෂාවට

අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය : 2026.10.30

පත්වීමක් සිදුකිරීමේ හෝ නොකිරීමේ අයිතිය ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව සතු වේ.

ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ **"භාෂා පරිවර්තක (සිංහල / දෙමළ - දෙමළ / සිංහල) 1 වන පන්තිය සඳහා බඳවා ගැනීම"** ලෙස සඳහන් කළ යුතු ය.

මෙම තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සහිත අයදුම්කරුවන් තම අධ්‍යාපන සුදුසුකම් ඇතුළත් කර සකස් කළ ජීව දත්ත පත්‍රිකාව, ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ (02) නම්, ලිපින, දුරකතන අංක ද ඇතුළත්ව අදාළ දින හෝ ඊට පෙර පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. වෘත්තීය පළපුරුද්ද අමතර සුදුසුකමක් සේ සැළකේ.

සැ.යු. - ඉහත තොරතුරු ඇතුළත් කර නොමැති අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සුරාබදු කොමසාරිස් ජනරාල්
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
අංක 353,
කෝට්ටේ පාර, රාජගිරිය.

10 - 674/1